උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 10

මුලින්ම මං වාර්තා චිත්‍රපටියක් අධ්‍යක්ෂණය කළේ විශ්ව විද්‍යාලයේ දෙවෙනි වසරේ ඉගෙන ගත්තු අවධියේ. ලංකාවේ දාගැබ් නිර්මාණය පිළිබඳව ගත්තා. මං බීම නැවැත්තුවා. ඒ සිදුවීම් පෙළ හරිම සිනමාත්මකයි කියලා මට දැන් හිතෙනවා. මං උපරිමයෙන්ම කැප වෙලා චිත්‍රපටියෙ වැඩ අවසන් කළා. ඊත් හදවතේ මුල්ලක දුලිනි හැංගිලා තනි වෙච්ච හැම මොහොතකම මාව රිදෙව්වා. කාලයත් ඒක ඒ වේදනාව මගේ ජීවිතේ කොටසක් බවට පත්වුණා. මං චිත්‍රපටි කරුවෙක් වශයෙන් නැගී හිටියෙ ඒ වේදනාවෙන් ලැබුණු අතිශය සංකීර්ණ හැඟීම් ගොන්නකුත් එක්ක. ඇතැම් විට මගේ සාර්ථකත්වයත් එයම වෙන්න ඇති කියලා මට හිතෙනවා. හැම නිර්මාණකරුවකුටම "මගේම නොවන ආදරයක්" තිබෙනවා කියලා කියමනකුත් තියෙනවනෙ.

මගේ පලවෙනි කෙටි චිත්‍රපටිය දැකලා අපේ අප්පච්චි බොහොම පැහැදුනා. අප්පච්චි තීරණයක් ගත්තා පිටරට යවලා මට සිනමාකරණය උගන්නන්න. චිත්‍රපටිය ගැන අප්පච්චි අම්මත් එක්ක හරි ඉහළින් කථා කලාලු.

"සරෝ අපේ පොඩි එකා අපි හිතුවට වඩා චිත්‍රපටි ගැන මොනවහරි දෙයක් තනියම ඉගෙන ගෙන කොළඹ ඉන්න ගමන්. මං ඉතිං හිතුවා පිටරට හොඳ ඇකඩමි එකකට යවලා කොල්ලට මේ විෂයය හරියට උගන්වන්න.අපේ කොල්ලො දෙන්නම නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්තු නිසා අපි පොත් පෑන් වලට ඇරෙන්න මහ ලොකුවට උන්ට වියදං කරලා නැහැනෙ සරෝ."

අම්ම එවෙලෙ ඉඳලා තියෙන්නෙ අවර මිටියක් ලියලියා කුල්ලට දාන ගමන්ලු.සියදෝරිස් මට විස්තරේ කියද්දි පරිසර වර්ණනාත් එක්කනෙ කියන්නෙ. නිල්හාන් කියනව වගේ ඉස්කෝලෙ යවලා උගන්නලා ගත්තනං සියදෝරිස්ට හොඳ තිරකථා රචකයෙක් වෙන්න තිබුණා. අම්මා එවෙලෙ අවර ලිවිල්ල නවත්තලා ඔසරි පොටෙන් කඳුළු පිහින්න ගත්තලු.අපේ අම්මට මාවයි අයියවයි නොදැක ඉන්න පුළුවන් උපරිම කාලය සති දෙකයි. මං කොළඹ හැම ඉඳන් සිකුරාදා රෑකම මාතලේ යන්නෙ අපේ අම්මගෙයි අප්පච්චිගෙයි මූණු බලන්න. බකිනි මලක් වගේ පිපිලා තියෙන අම්මගෙ මූණයි අප්පච්චිගෙ ගාම්භීර ඇස් දෙකයි බලලා ඉරිදා උදේම ආපහු කොළඹ එනවා.ඉතිං මං ඇමරිකාවට යනවා කිව්වම අපේ අම්මා අඬන එකේ මහ ලොකු පුදුමයක් නැහැ.මං නැති සතිය පුරා හැමදේම තනියම කරගන්න අපේ අම්මා මං ගෙදර ආවාම සැමන් ටින් එකක් කඩා ගන්න, ඉඳිකට්ටට නූල දාගන්න , අල්මාරියෙ උඩ තියෙන බඩුවක් ගන්න මට කථා කරනවා විටින් විට.මං කාමරේ ඇතුලට වෙලා මගේ වැඩක් කරගෙන ඉන්නනවට තියෙන අකමැත්ත තමා අපේ අම්මා ඒ විදියට ප්‍රකාශ කරන්නෙ.

අපේ ගෙදර මුළුතැන්ගෙයි වැඩ පලවලට හිටිය ආච්චි අම්මා නැතිවුනාට පස්සෙ කාවවත් ඒ වැඩ වලට ගත්තෙ නැහැ. මං ඒකට පැහැදිලි හේතුවක් දන්නෙත් නැහැ.අවුරුදු මාසෙටයි දාන මාන තියෙන කාලවලටයි සියදෝරිස් නංගි කෙනෙක් ඇවිත් අම්මට උදව් වෙනවා.නැත්තං අපේ ගෙදර ඉවුම් පිහුම් වැඩ ටික කරේ අම්මා තනියම. ඉතුරු වැඩ හැමදේම කලේ සියදෙ-ෝරිස්.සමහර දාට අම්මා හෝදපු රෙදි වන්න අප්පච්චි උදව් වෙනවා මං ජනේලෙන් දක-නවා.ඒ දෙන්නා මංගල යෝජනාවකින් විවාහ වුණ දෙන්නෙක් වුණාට පුදුම ආදරේකින් සහ අවබෝධයකින් ජීවත්වුණා.අපේ අම්මා වෙනස් විදියකට ඇහි පිල්ලමක් ගැහුවත් අප්පච්චිට ඒක තේරෙනවා.

ඒ දෙන්නම ආර්තීව බලා ගත්තෙ තමන්ගෙ දුව වගේ.සති දෙකකට වරක් බදාදාට ඒ දෙන්න කොළඹ ඇවිත් මාත් එක්කගෙන ආර්තිගෙ නවාතැන් පලට යනවා එයාව බලන්න.ආර්තිගෙ නවාතැන කලාගාරයක් වගේ.බඩුමුට්ටු හරිම සුළු ප්‍රමාණයක් තියෙන්නෙ.රාමු කරපු සිතුවමුයි , පින්තාරු කරපු මැටි බඳුනුයි තමා වැඩිපුරම තියෙන්නෙ.දොර ජනෙල් තිර පවා ආර්තිම මහලා මෝස්තර ඇඳපුවා.ආර්තීට අපේ අම්මා මහන්න ගොතන්න වගේම හොඳට උයන්නත් පුරුදු කරා.ආර්තිගෙ සිහින් දිගු ඇඟිලි ඒ වැඩ වලට කදිමට ගැලපුණා.අපි යන දවසට එයා වෙනස් කෑම වේලක් අපි වෙනුවෙන් හදලා තියෙනවා.

මං ඇමරිකාවට යන්න කලින් අපි ආර්තීව බලන්න ගියා. එතකොට එයා නිල්හාන්ව බැඳලා ලොකු දුවව ලැබෙන්න හිටියා.ඒත් මං ආසම විදියට මැලේසියානු කෑම වේලක් හදලා තිබුණා.අපේ අප්පච්චි තමන්ගෙ බඳුනෙ තිබුණු, කුකුල්මස් සහ ඉරිඟු අඹරා මුසු කරපු සුප් එක බොහොම වේගෙන් නිමා කලා. අප්පච්චි හරිම කැමතියි අපේ ආර්තීගෙ අමුතු තාලෙ කෑම කන්න.මේ කාලෙ වෙද්දි දුලිනි එයාට ලැබෙන්න හිටිය දරුවා අහිමි වීමේ වේදනාවත් උහුලන් කොහොම හරි එයාගෙ රස්සාවත් කරගෙන දුක්බර ජීවිතයක් ගෙවමින් ඉන්න බව මං දැනං හිටියා. ඒ දුක ඊයම් බරුවක් වගේ මගේ හිත පතුලේ අප්‍රමාණ වේදනාවක් වරින් වර ඇති කළා.

ආර්තී දුලිනිව බලන්න රෝහලට ගිය වෙලේ දුලිනි ජනේලෙ ලඟට වෙලා ඒ කුඩා රෝහලේ මිදුලෙ පිපුණු මල් දිහා හිස් බැල්මෙන් බලාගෙන හිටියලු . ආර්තීව දැක්ක ගමන් " අනේ අක්කේ මගෙ පැටියා...." කියලා හයියෙන් ඇඬුවලු.නිල්හාන් එදා තමා හරියට දුලිනිව දැක්කෙ. නිල්හාන් ඉගෙන ගත්තෙ ආර්තීගෙ විශ්ව විද්‍යාලයේ නිසා එයා දුලිනිව දැකලා තිබුණෙ පින්තූර වලින් විතරයි.ඇරත් ඒගොල්ලන්ගෙ විවාහ මංගල්ලෙට සසංක තනියම ආවා මිසක් දුලිනිව එක්කං ආවෙ නැහැ.නිල්හාන් ගෙදර ඇවිත් එදා මට සෑහෙන දොස් කිව්වා. ඒ දෝෂාරෝපණය මොනතරං කටුකද කිව්වොත් ආර්තිට ඇඬුනා.

## අයියෙ මට කනට දෙකක් දෙන්න මට ඒක දරා ගන්න පුළුවන්



මාස ගනනාවක් මුළුල්ලේ තොරතුරු රැස් කරලා ඒ ඇසුරෙන් හදපු මිනිත්තු විස්සක කෙටි චිත්‍රපටිය මං හිතුවට වඩා අවධානයකට ලක්වුණා වගේම ඒ අවුරුද්දෙ ප්‍රශස්ථ කෙටි චිත්‍රපටි ඇගයීම් උළෙලකදී අවසාන වටයටත් තේරුණා.කෙටි චිත්‍රපටිය මං නිර්මාණය කරන අවධිය වෙද්දි මං හිටියෙ මානසික වශයෙන් උපරිමව කඩා වැටිලා. වැඩි කාලයක් බීමතින් හිටපු ඒ යුගය මගේ ජීවිතේ අඳුරුම කාලය වෙන්න ඇති. මං මාස ගනන් මාතලේ නොගිහින් කොළඹ ට වෙලා හිටියා. අන්තිමට අයියා ආවා මගේ නවාතැනට මං නොහිතපු දවසක. එදත් මං රෑ වෙරිමත හිඳෙනකං නිදාගෙන හිටියෙ. කාමරේ මුළු වල තිබ්බ්ච්ච කාලෙ බෝතල් , භාගෙ බෝතල් දැකපු ගමන් අයිය හැමදේම වටහගන්න ඇති. අයියගෙ පිටිපස්සෙන් කාමරේට ඇතුල්වෙච්ච තනුරා අක්කා හිස් බෝතලුයි මූඩියි එකතු කරලා ලොකු බෑග් එකකට දැම්මා. අයියා මගේ හෝදන්න තිබ්බ්ච්ච ඇඳුම් සියල්ල බේසමකට එකතු කරා. අපේ අයිය කියන්නෙ තමන්ගෙ ඇඳුමක්වත් හෝදන්න ගිහින් දාපු කෙනෙක් නෙමේ. කාලයක් අම්මත් පසු කලෙක තනුරා අක්කත් එයාගෙ හැමදේම හොයලා බලල කලානෙ. එහෙව් අපෙ අයිය මගේ කිලිටි රෙදි එකතු කරලා බේසමකට දාලා කොස්සක් අරං ආවා කාමරේ අතුගාන්න.මං ඇඳෙන් බැහැලා ගිහිං අයියගෙ අතින් අල්ලලා ඇද්දා.

"අයියෙ මට කනට දෙකක් දෙන්න. මට ඒක දරා ගන්න පුළුවන්"

අයිය මාව වැරෙන් අල්ලලා බදාගත්තා.

"මෙහෙම වැටෙන්න එපා මල්ලි. අම්මයි අක්කයි හූල්ලනවා ගෙදර. උඹට අපි ඉන්න බව අමතක වුණාද"

අපේ අයියගෙ කඳුලක් මගේ බෙල්ලට වැටුණා. තනුරා අක්කා පිටි අත්ලෙන් එයාගෙ කඳුළු වැහුවා.අපි තුන්දෙනා එදා එළියට ගිහින් රෑ කෑම



උපේක්ෂා සේනානායක
ලියයි

**මතු සම්බන්ධයි**